# ජාතික රාජ්‍ය සභාවේ
# 1975 අංක 11 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 11 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 46/71.

1956 අංක 46 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 11 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1956 අංක 46 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 46 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය හෝ පාලක සභාව විසින් පිළිගත් වෙනත් එවැනි සුදුසුකමක් දරන්නකු නම්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"ලියාපදිංචිය වලංගුව පවතින කාලසීමාව.

5. පශු වෛද්‍යවරයකු ලෙස හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු ලෙස වූ යම් තැනැත්තකුගේ ලියාපදිංචි කිරීම එම ලියාපදිංචියෙහි පටහැතිව කුමක් සඳහන්ව ඇත ද ඒ ලියාපදිංචි කිරීම කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින තෙක් වලංගුව පවතින්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේද වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) ලියාපදිංචි කළ පශු වෛද්‍යවරුන් විසින් තෝරා ගනු ලබන ලියාපදිංචි කළ පශු වෛද්‍යවරුන් පස් දෙනෙක් ;

(ඇ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් ලියාපදිංචි කළ පශු වෛද්‍යවරුන් වන සාමාජිකයන් දෙදෙනෙක්. ඔවුන් අතුරින්,—

(i) එක් තැනැත්තකු ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාව ඉගැන්වීම පිළිබඳ සම්පූර්ණ වගකීම භාර තැනැත්තා වශයෙන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් තෝරා පත් කරනු ලැබ සිටින තැනැත්තා විය යුතුය ;

ඊ 09440—10,044 (74/09)

(ii) අනෙක් තැනැත්තා පශු වෛද්‍ය විද්‍යාව උගන්වන ආචාර්යවරුන් අතුරින් ලියාපදිංචි කළ පශු වෛද්‍යවරුන් වන තැනැත්තන් විසින් තමන් අතුරින් තෝරා පත් කරනු ලබන තැනැත්තකු විය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) පාලක සභාවේ සාමාජිකයන් යටත් පිරිසෙයින් හය දෙනකුවත් රැස්වීමට පැමිණ සිටිය හොත් මිස පාලක සභාවේ යම් රැස්වීමක දී කිසිම කටයුත්තක් නොකළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම.

29. ලේඛනයේ දක්වා ඇති තමාගේ සුදුසුකම් වලට අතිරේක යම් සුදුසුකමක් ලියාපදිංචි කළ පශු වෛද්‍යවරයකු විසින් ලබා ගන්නා ලද අවස්ථාවක දී, ගාස්තුව නියම කරනු ලබන තුරු, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ගාස්තුවක්, ලියාපදිංචි කිරීමේ නිලධරයාට හෝ ලේඛකාධිකාරීට ඔහු විසින් ගෙවන ලද විට, ඒ අතිරේක සුදුසුකම පාලක සභාව විසින් පිළිගනු ලැබුවහොත්, ඒ සුදුසුකම ලේඛනයෙහි දැක්වෙන තම සුදුසුකම්වලට එකතු කර ගැනීමට ඔහුට හිමිකම් ලැබේ. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" පශු වෛද්‍යවරුන්ගේ උපාධි, අභිඥාන පත්‍ර, ආදිය.

34. තමා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය හෝ පාලක සභාව විසින් පිළිගන්නා ලද වෙනත් සුදුසුකමක් හෝ දරන්නකු නම් මිස, තමාට යම් පශු වෛද්‍ය විද්‍යා වෘත්තියක යෙදීමට හිමිකම ලබා දෙන උපාධියක්, අභිඥාන පත්‍රයක්, බලපත්‍රයක් හෝ සහතිකයක් තමා දරන බව හඟවන යම් අභිධානයක්, විස්තරයක් හෝ සංක්ෂේපණයක් කිසිම තැනැත්තකු විසින් තම නමට එකතු නොකළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නොමැති කරුණු පිළිබඳව පාලක සභාවේ තීරණ බල පැවැත්විය යුතු බව.

39. මේ පනතෙහි ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් පිළිබඳව පාලක සභාවේ තීරණය බලපැවැත්විය යුතු ය. ".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ "නියමිත" යන්නෙහි අර්ථ කථනයට පෙරාතුවම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

'"සත්ව සංවර්ධන හා සෞඛ්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ" යන්නෙන් කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව සංවර්ධන හා සෞඛ්‍ය) වශයෙන් හෝ එම අධ්‍යක්ෂ ලෙස ක්‍රියා කිරීමට හෝ පත් කළ තැනැත්තා අදහස් වේ ;'.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ඉවත් කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ "ලංකා" යන වචනය යෙදෙන කොතැනක වුව ද ඒ වෙනුවට "ශ්‍රී ලංකා" යන වචන ඒ ප්‍රඥප්තියෙහි ආදේශ කරනු ලැබේ. "ලංකා" යන වචනය වෙනුවට "ශ්‍රී ලංකා" යන වචන ආදේශ කිරීම.